වාර්ෂික ආර්ථික විවරණය 2024

ශ්‍රී ලංකා මහ බැංකුව

ආචාර්ය ලසිත පත්බේරිය

අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2025 මැයි 27

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80(3) වන වගන්තිය

“මහ බැංකුව විසින්, එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් **මාස හතරක කාලසීමාවක්** ඇතුළත තම ප්‍රතිපත්තිමය අරමුණු සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය අවධාරණය කරමින්,

ඒ මුදල් වර්ෂය තුළ ආර්ථිකයේ තත්ත්වය පිළිබඳව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද **වාර්තාවක් ප්‍රසිද්ධ කර,**

එය මුදල් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු බවට මහ බැංකුවේ අධිපතිවරයා විසින් වගබලා ගත යුතු ය.

එම මූල්‍ය වර්ෂය තුළ **මහ බැංකුව විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති පිළිබඳව සමාලෝචනයක් සහ විශ්ලේෂණයක්** වාර්තාවට ඇතුළත් විය යුතු ය”

වාර්ෂික ආර්ථික විවරණයෙහි අන්තර්ගතය

1. මූලික ආර්ථික දර්ශක සහ මූලික සමාජ දර්ශක
2. සමස්ත සාරාංශය
3. තොරතුරු රූප සටහන
4. පරිච්ඡේද
   - පළමුවන පරිච්ඡේදය : සාර්ව ආර්ථික ප්‍රවණතා
   - දෙවන පරිච්ඡේදය : මූල්‍ය පද්ධතියේ තත්ත්වයන්
   - තුන්වන පරිච්ඡේදය : මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය
   - හතරවන පරිච්ඡේදය : සාර්ව ආර්ථික ඉදිරි දැක්ම
5. විශේෂ සටහන්
6. විශේෂාංග රූප සටහන්
7. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග
8. සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය
9. විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

*සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයන්හි සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන Excel ආකෘති මගින් මාර්ගගතව ලබා ගත හැක

වසර දෙකකට පෙර අත්විඳින ලද දරුණුතම ආර්ථික පසුබෑමෙන් පසුව, 2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවරව යථා තත්ත්වයට පත් වීම අඛණ්ඩව සිදු විය

යථා තත්ත්වයට පත් වීමේ මාවත දුෂ්කර වුවද, අධික ණය බර හේතුවෙන් පීඩාවට පත් වූ බොහෝ රටවලට සාපේක්ෂව, එය සැලකිය යුතු ලෙස වේගවත්ව සිදු විය

ජා.මූ. අරමුදල් වැඩසටහනේ සහාය ඇතිව ප්‍රතිසංස්කරණ අඛණ්ඩව සිදු වෙමින් දේශපාලන ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් වූ අතර, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම බොහෝ දුරට අවසන් විය

"තෝරාගත් ණය පැහැර හැරීමේ" ශ්‍රේණිගත කිරීමෙන් රට ඉවත්වීමට මෙය සහාය විය

තොරතුරු රූප සටහන : ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම

දර්ශකය	අර්බුදයේ උච්චතම අවස්ථාව	2024
උද්ධමනය (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)	69.8 (සැප්. 2022)	-1.7 (වසර අවසානයට)
ද.දේ.නි.යේ වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය, %)	-7.3 (2022)	5.0
ඒක පුද්ගල ද.දේ.නි. (එ.ජ. ඩොලර්)	3,464 (2022)	4,516
පොලී අනුපාතිකය (ප්‍රමුඛ ණය අනුපාතිකය, %)	29.7 (4 වන සතිය, නොවැ. 2022)	8.9 (වසර අවසානයට)
පෞද්ගලික අංශයේ ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය, %)	-9.7 (මැයි 2023)	10.7 (වසර අවසානයට)
විනිමය අනුපාතිකය (එ.ජ. ඩොලරයට රුපියල්)	365 (2 වන සතිය, මැයි 2022)	293 (වසර අවසානයට)

දර්ශකය	අර්බුදයේ උච්චතම අවස්ථාව	2024
දළ නිල සංචිත (චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත්ව, එ.ජ. ඩොලර් බිලියන)	1.7 (අගෝ. 2022)	6.1 (වසර අවසානයට)
අක්‍රීය ණය අනුපාතය/තුන්වන අදියරේ ණය අනුපාතය* (%)	13.6 (සැප්. 2023)	12.3 (වසර අවසානයට)
මධ්‍යම රජයේ ණය** (ද.දේ.නි.යෙහි % ලෙස)	114.2 (2022)	96.1 (වසර අවසානයට)
රජයේ මුළු ආදායම සහ ප්‍රදාන (ද.දේ.නි.යෙහි % ලෙස)	8.3 (2021)	13.7
සමස්ත රාජ්‍ය අයවැය ශේෂය (ද.දේ.නි.යෙහි % ලෙස)	-11.7 (2021)	-6.8

** 2020 වසරෙන් පසු දත්ත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මත පදනම් වූ වාර්තාකරණයට අනුකූල වේ*

***2024 වාර්ෂික ආර්ථික විවරණයෙහි 1.21 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පාද සටහන වෙත යොමුවන්න*

ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම

උද්ධමනය
(කො.පා.මි.ද., වාර්ෂික සාමාන්‍ය, %)



මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය, %)



පොලී අනුපාතිකය
(වසර අවසානයට,
ප්‍රමුඛ ණය අනුපාතිකය, %)



ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය
(එ.ජ. ඩොලර්)



විනිමය අනුපාතිකය
(වසර අවසානයට,
එ.ජ. ඩොලරයට රුපියල්)



පෞද්ගලික අංශයේ ණය වර්ධනය
(වසර අවසානයට, වාර්ෂික ලක්ෂ්‍යමය, %)

අක්‍රීය ණය අනුපාතය/තුන්වන අදියරේ ණය අනුපාතය*
(වසර අවසානයට, %)

*2020 වසරෙන් පසු දත්ත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මත පදනම් වූ වාර්තාකරණයට අනුකූල වේ

දළ නිල සංචිත
(වසර අවසානයට, එ.ජ. ඩොලර් බිලියන)

රජයේ මුළු ආදායම සහ ප්‍රදාන
(ද.දේ.නි.යෙහි % ලෙස)



සමස්ත රාජ්‍ය අයවැය ශේෂය
(ද.දේ.නි.යෙහි % ලෙස)



මධ්‍යම රජයේ ණය**
(වසර අවසානයට, ද.දේ.නි.යෙහි % ලෙස)



**2024 වාර්ෂික ආර්ථික විවරණයෙහි 1.21 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පාද සටහන වෙත යොමුවන්න

උද්ධමනය සහ මූර්ත අංශයේ ප්‍රවණතා

2024 වසර තුළ උද්ධමනය සමස්තයක් ලෙස අඩුවීමේ ප්‍රවණතාවක් අනුගමනය කළ අතර වසරේ අවසාන කාලයේදී අවධමන මට්ටම් කරා ළඟා විය

මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

- **කිහිප වතාවක් විදුලි ගාස්තු අඩු කිරීම මතුපිට උද්ධමනයේ පහළ යෑම සඳහා වඩාත් දායක විය**
- **දායක වූ වෙනත් සාධක:**
  - ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම
  - ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම
  - සංඛ්‍යානමය පදනම් බලපෑම

2024 වසරේ දී පොදු මිල මට්ටම පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය

- **ආහාර අයිතමවල මිල ගණන්** සමස්තයක් ලෙස **පහළ යෑමේ ප්‍රවණතාවක්** පෙන්නුම් කළේය
  - මිල උච්චාවචනය වන ආහාර අයිතමවල මිල ගණන් පහළ යෑම
  - ආනයනික ආහාර අයිතමවල මිල ගණන් අඩු වීම
- **ආහාර නොවන අයිතමවල** මිල ගණන් ද සමස්තයක් ලෙස **පහළ ගියේය**
  - මිල සූත්‍ර මත පදනම්ව වූ පරිපාලිත මිල ගණන් පහත දැමීම

දැනට **තාවකාලිකව පවතින අවධමන තත්ත්වය, ජීවන වියදම** මෙන්ම නිෂ්පාදන පිරිවැය යම් ප්‍රමාණයකට **අඩු කිරීමට** සහාය වනු ඇත

1.2 රූප සටහන: කො.පා.මි.ද. සහ මතුපිට උද්ධමනය



ආයතනික සහ කුටුම්බ යන දෙඅංශයෙහි ම **2024** වසර තුළ දී උද්ධමන අපේක්ෂා සමස්තයක් ලෙස පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, එය වාර්තා වූ උද්ධමනයේ හැසිරීමට අනුකූල විය

ශ්‍රී ලංකා ආර්ථිකය, අඛණ්ඩව වසර දෙකක් පුරා පැවති සංකෝචනයෙන් පසුව, 2024 වසරේ දී 5.0%ක මූර්ත ආර්ථික වර්ධනයක් වාර්තා කළේය

1.8 රූප සටහන: වාර්ෂික මූර්ත ද.දේ.නි. වර්ධන අනුපාතික (අ)



(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

පවත්නා මිල ගණන් අනුව සමස්ත ඉල්ලුම

ආර්ථික ක්‍රියාකාරකම	රුපියල් බිලියන		ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (%)	
	2023	2024	2023	2024
1. දේශීය ඉල්ලුම	**28,011.5**	**30,683.4**	**102.2**	**102.6**
1.1 පරිභෝජන	21,270.3	22,623.0	77.6	75.7
1.2 ආයෝජන (දළ ප්‍රාග්ධන සම්පාදනය)	6,741.2	8,060.3	24.6	27.0
2. ශුද්ධ විදේශීය ඉල්ලුම	**-591.7**	**-784.8**	**-2.2**	**-2.6**
3. මුළු ඉල්ලුම (ද.දේ.නි) (1+2)	**27,419.8**	**29,898.6**	**100**	**100**

- නිෂ්පාදන හා ඉදිකිරීම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් <u>කර්මාන්ත අංශය වර්ධනය වීම</u> සමස්ත වර්ධනයට හේතු විය
- ප්‍රවාහන හා නවාතැන් පහසුකම් සැපයීමේ සේවාවල තිරසර වර්ධනය හේතුවෙන් <u>සේවා අංශය ද ශක්තිමත් ලෙස වර්ධනය විය</u>
- පරිභෝජන වියදම් සහ ආයෝජන වියදම් වර්ධනය හේතුවෙන් <u>දේශීය ඉල්ලුම වර්ධනය විය</u>

2024 වසරේ දී ජනගහන හා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පහත වැටුණු අතර, සේවා වියුක්ත අනුපාතිකය පහළ ගියේය

1.5 සංඛ්‍යා සටහන: කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)

ශීර්ෂය	2023	2024 (ආ)
කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000	17,306	**17,551(ඇ)**
ශ්‍රම බලකාය පුද්ගලයන් '000	8,408	**8,316**
සේවා නියුක්ත	8,010	**7,949(ඇ)**
සේවා වියුක්ත	398	**367(ඇ)**
සේවා වියුක්ත අනුපාතිකය	4.7	**4.4**
පුරුෂ	3.6	**ලැ.නො.**
ස්ත්‍රී	7.0	**ලැ.නො.**
ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඈ)	48.6	**47.4**
පුරුෂ	68.6	**67.4**
ස්ත්‍රී	31.3	**29.8**

(ඇ) මෙම අගයන් 2025.03.28 දිනට පවතින තොරතුරු වලින් ව්‍යුත්පන්න කර ඇත.

4.4% සේවා වියුක්ත අනුපාතිකය

2023 වසරේ දී මිලියන 22.0 → **2024 වසරේ දී මිලියන 21.9**

0.5% මධ්‍ය වාර්ෂික ජනගහනය

47.4% ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය

5.8% විදේශ රැකියා සඳහා පිටත්වීම

* 2024 වසරේ ජන හා නිවාස සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය- මිලියන 21.763

මුදල් අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

2024 වසරේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වඩාත් ලිහිල්ව පැවතුණි

2024 වසරේ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරන ලද්දේ;

- උද්ධමනය අඩු මට්ටමක පැවතීම
- උද්ධමන අපේක්ෂා මනාව පාලනය වී පැවතීම
- දැඩි රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යාම
- විදේශීය අංශයේ ශක්තිමත් කාර්යසාධනය

2024 වසරේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීම

මාර්තු	ජූලි	නොවැම්බර්
පදනම් අංක 50	පදනම් අංක 25	පදනම් අංක 50 පමණ

* මෙය 2023 වසරේ දී සිදු කරන ලද පදනම් අංක 650ක අඩු කිරීමට අමතරව වේ

මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය කෙරෙහි වැඩි අවධානයක්

- ✓ සමාජ මාධ්‍ය ජාල
- ✓ පරිශීලක හිතකාමී සහ සරල සන්නිවේදන ක්‍රමවේද
- ✓ සම්ප්‍රදායික සන්නිවේදන මාර්ග වැඩිදියුණු කිරීම
- ✓ පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම
- ✓ ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ වාර්තා

- මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කරමින් 2025 මැයි මාසයේදී **එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75%ක් දක්වා පදනම් අංක 25කින් අඩු කරන ලදී**

ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙළඳපොළ පොලී අනුපාතික තුළින් පිළිබිඹු විය

වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව පහළ ගියේය





සටහන: ස්ථම්භ ප්‍රස්ථාරයෙන් 2023 සහ 2024 වසරවලදී පොලී අනුපාතිකවල වාර්ෂික වෙනස්වීම නිරූපණය වේ.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

2024 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සැලකියයුතු ලෙස ඉහළ ගියේය



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනයේ සැලකිය යුතු ප්‍රගතිය, මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ අවදානම් අධිමිල ක්‍රමයෙන් අඩු වීම හේතුවෙන් 2024 වසරේ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ ගියේය

2024 වසරේ දී පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි සැලකිය යුතු ලෙස ප්‍රසාරණයක් වාර්තා විය

පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි මාසික වෙනස්වීම සහ ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)



ප්‍රධාන අංශවලට ලබා දුන් ණයෙහි කාර්තුමය වෙනස සහ ප්‍රධාන අංශවලට ලබා දුන් ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)



ප්‍රධාන අංශවලට ලබා දුන් ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)

කෘෂිකාර්මික සහ ධීවර	12.6%
සේවා	12.3%
පෞද්ගලික ණය සහ අත්තිකාරම්	11.3%
කර්මාන්ත	8.4%

සියලුම ප්‍රධාන ආර්ථික අංශ සඳහා ණය ප්‍රසාරණය සිදු වී ඇත

බැංකු පද්ධතිය මගින් රාජ්‍ය අංශයට වූ ණය ලබා දීම් මෑතකදී වෙනස් වී ඇත

1.15 රූප සටහන: බැංකු පද්ධතියෙන් රාජ්‍ය අංශයට ලබා දුන් ශුද්ධ ණයෙහි වාර්ෂික වෙනස



* ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2023 සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී

2024 වසර තුළ දී මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 602.7කින් සැලකිය යුතු ලෙස පහළ යෑමට හේතු වූයේ,

- *මහ බැංකුව සතු රජයේ භාණ්ඩාගාර බිල්පත් තොගය කල් පිරීම*
- *සහභාගීත්ව ආයතන විසින් මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම මත රඳා පැවතීම අඩු වීම*

එසේ වුවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 587.8කින් ඉහළ ගියේය

2024 වසර තුළ දී රජය සතු වාණිජ ව්‍යාපාර බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 113.1කින් පහළ ගියේය,

- *ප්‍රධාන වශයෙන් රජය සතු වාණිජ ව්‍යාපාරවල මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු වීම මධ්‍යයේ රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාර සිය ණය වගකීම් ශුද්ධ පදනම මත නැවත පියවීම හේතුවෙන්*

ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන යෑම මහ බැංකුවේ මූලික අරමුණ වේ

මුදල් ප්‍රතිපත්ති රාමුව

- ✓ **නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට** අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය
- ✓ මහ බැංකුව විසින් **මතුපිට උද්ධමනය 5%ක ඉලක්කගත අගයක** පවත්වා ගැනීම අවශ්‍ය වේ

විනිවිදභාවය සහ වගවීම

- ✓ අඛණ්ඩව කාර්තු දෙකක් සඳහා උද්ධමන ඉලක්කය සපුරා නොගතහොත් **මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කර එය මහජනතාවට ද ලබා දිය යුතුය**
- ✓ මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය හා සම්බන්ධ කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා **සම්බන්ධීකරණ සභාව** කාර්තුමය වශයෙන් රැස්වේ
- ✓ **මුදල් ප්‍රතිපත්ති වාර්තාව** අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරයි

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය

- ✓ 2024 දී මහ බැංකුව එහි ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට **තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත යොමු විය**
- ✓ **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මෙහෙයුම් ඉලක්කය** ලෙස අඛණ්ඩව පවතී

විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පුළුල් වූ නමුත්, තවදුරටත් ඉතිහාසයේ පැවති සාමාන්‍යයට වඩා අඩු මට්ටමක පවතී

2024: එ.ජ. ඩොලර් බිලියන 6.1
2023: එ.ජ. ඩොලර් බිලියන 4.9

වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය

2025 පළමු කාර්තුව: එ.ජ. ඩොලර් බිලියන 1.5
2024 පළමු කාර්තුව: එ.ජ. ඩොලර් බිලියන 1.2

අපනයන සංයුතිය

අපනයන වර්ධනය 7.2% (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත), මේ සඳහා

- ඇඟලුම් අංශය යථා තත්ත්වයට පත්වීම,
- ඛනිජ තෙල් අපනයන ඉහළ යෑම හේතු විය



ආනයන සංයුතිය

ආනයන වර්ධනය 12.1% (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත), මේ සඳහා

- ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යෑම,
- ආනයන සීමා කිරීම් ලිහිල් කිරීම,
- හිතකර ගෝලීය මිල වෙනස්වීම් හේතු විය



ද්විපාර්ශ්වික වෙළඳ ශේෂයන්

- ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සමස්ත වෙළඳාම- එ.ජ. ඩොලර් බිලියන 3.4
- ඉන්දියාව සමඟ සමස්ත වෙළඳාම- එ.ජ. ඩොලර් බිලියන 4.8
- චීනය සමඟ සමස්ත වෙළඳාම- එ.ජ. ඩොලර් බිලියන 4.6



2024 වසරේ දී සේවා ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය

සේවා අංශයේ ලැබීම් සහ ගෙවීම්



සටහන: තද පැහැති ස්ථම්භ 2024 වසරේ අගයන් නිරූපණය කරන අතර ලා පැහැති ස්ථම්භ 2023 වසරේ අගයන් නිරූපණය කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- 2024 වසරේ දී සේවා ගිණුමේ **අතිරික්තය**, 2023 වසරේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 3.1ට සාපේක්ෂව **එ.ජ. ඩොලර් බිලියන 3.4ක්** දක්වා වර්ධනය විය
- **සංචාරක, මුහුදු ප්‍රවාහනය, පරිගණක සහ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම** යන අංශ ඇතුළු ප්‍රධාන සේවා අංශ වෙත වූ ඉහළ ලැබීම් මෙම වර්ධනයට හේතු විය
- 2023 වසරේ දී වාර්තා වූ මිලියන 1.49ක සංචාරක පැමිණීම් හා සසඳන විට, **2024 වසරේ දී සංචාරක පැමිණීම් මිලියන 2.05ක්** වාර්තා කරමින් සංචාරක අංශය තවදුරටත් එහි වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය
    - 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.1ක් වූ සංචාරක ඉපැයීම, **2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.2ක්** ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර එය **53.2%** ක **වාර්ෂික වර්ධනයකි**

2024 වසරේ දී විදේශීය ජංගම ගිණුම, අඛණ්ඩව දෙවන වසරටත් සැලකිය යුතු අතිරික්තයක් වාර්තා කළේය

මාසික විදේශීය ජංගම ගිණුමේ සංඛ්‍යාන දත්ත



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2024 වසරේ දී ජංගම ගිණුම, එ.ජ. ඩොලර් බිලියන 1.2ක අතිරික්තයක් වාර්තා කළේය

සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වලින් වූ ඉහළ ලැබීම් හේතුවෙන් මෙම අතිරික්තය වාර්තා කළේය

2023 එ.ජ. ඩොලර් මිලියන (සංශෝධිත)		**2024** එ.ජ. ඩොලර් මිලියන (තාවකාලික)
-4,900	වෙළඳ ශේෂය	-6,069
3,053	සේවා ගිණුම (ශුද්ධ)	3,435
-2,548	ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ)	-2,599
5,834	ද්විතීයික ආදායම් ගිණුම (ශුද්ධ)	6,439
1,439	ජංගම ගිණුම (ශුද්ධ)	1,206

විනිමය අනුපාතිකයේ විටින් විට විචලනයන් පැවතියද, අඛණ්ඩව දෙවන වසරටත් ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය

දෛනික විනිමය අනුපාතිකයේ වෙනස්වීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීම / අවප්‍රමාණය වීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මහ බැංකුවේ මැදිහත්වීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **2024** වසරේ දී වාර්තාගත මට්ටමක විදේශ විනිමය මිලදී ගනිමින්, මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් විය
- **නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය** යටතේ, විනිමය අනුපාතිකයේ හැසිරීම **බොහෝ දුරට ඉල්ලුම් සහ සැපයුම් තත්වයන් මත තීරණය වේ**
- **මුදල් අවප්‍රමාණය වීම සහ අතිප්‍රමාණය වීම යන දෙකෙහිම වාසි මෙන්ම අවාසිද ඇත**

අර්බුදයෙන් පසු, දළ නිල සංචිත යථා තත්ත්වයට පත්වීමක් වාර්තා කර ඇත

දළ නිල සංචිත සහ ශුද්ධ ජාත්‍යන්තර සංචිත



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචිත ප්‍රමාණාත්මකභාවය: ආනයනික මාස



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචිත ප්‍රමාණාත්මකභාවය: කෙටිකාලීන ණයවල % ලෙස



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අර්බුදකාරී කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2024 වසරේ දී සංචිත ප්‍රමාණාත්මකභාවය තියුණු ලෙස වැඩිදියුණු විය

2025 වසරේ අප්‍රේල් මස අවසානයට (තාවකාලික)

- දළ නිල සංචිත = එ. ජ.ඩොලර් බිලියන **6.3**
- සංචිත ප්‍රමාණාත්මකභාවය: ආනයනික මාස = 3.9
- සංචිත ප්‍රමාණාත්මකභාවය: කෙටිකාලීන ණයවල % ලෙස = 123%

(2024 වසරේ දෙසැම්බර් මස අවසානයේ පැවති කෙටිකාලීන විදේශීය ණය තත්ත්වය මත පදනම්ව)

රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා

2024 වසරේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් කැපී පෙනෙන ලෙස වර්ධනය විය

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් (ද.දේ.නි.යෙහි % ලෙස)



මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

- ප්‍රාථමික ශේෂය - රුපියල් බිලියන 650ක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2.2%ක) අතිරික්තයක් වාර්තා කළේය
- ජංගම ගිණුම – රුපියල් බිලියන 1,309ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 4.4%ක) දක්වා හිඟය අඩු විය
- සමස්ත අයවැය ශේෂය - රුපියල් බිලියන 2,040ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 6.8%ක) දක්වා සමස්ත අයවැය හිඟය අඩු විය

ආදායම් වැඩිකර ගැනීම සහ වියදම් තාර්කිකරණය සඳහා වන දැඩි ක්‍රියාමාර්ගයන් 2024 වසර තුළ දී අඛණ්ඩව පැවතුණි

1.23 රූප සටහන: රාජ්‍ය ආදායමේ සංයුතිය - 2024



මූලය: මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

1.24 රූප සටහන: රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2024



මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

2024 වසර තුළ දී රජයේ ආදායම 32.2%කින් සහ පුනරාවර්තන වියදම 13.6%කින් වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය) විය

මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රගතියක් පෙන්නුම් කළේය

මධ්‍යම රජයේ නොපියවූ ණය*



මූලයන්: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

- නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ශක්තිමත් වර්ධනය සහ ශ්‍රී ලංකා රුපියලෙහි අගය ඉහළ යෑමෙන් විදේශ මුදල්වලින් නාමනය කරන ලද ණය මත ඇති වූ බලපෑම හේතුවෙන්, **මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පහළ ගියේය**
- අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා **රජය මූලිකවම දේශීය මූලාශ්‍ර මත තවදුරටත් රඳා පැවතුණි**
- ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන ලද තත්ත්වය අවසන් කරමින්, 2024 වසර තුළ දී **ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට සම්පූර්ණ කළේය**

- ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී **ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවන ලදී**

FitchRatings: RD → CCC+
Moody's: Ca → Caa1

*මධ්‍යම රජයේ නොපියවූ ණය සම්පාදනය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා 2024 වාර්ෂික ආර්ථික විවරණයෙහි 53 පිටුව බලන්න

මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති සහ කාර්යසාධනය

වර්ධනය වූ සාර්ව මූල්‍ය තත්ත්වයන්ගේ සහායයෙන් 2024 වසරේ දී මූල්‍ය අංශයේ කාර්යසාධනය අඛණ්ඩව වැඩිදියුණු විය

- බැංකු අංශය විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුකූලත්වය දක්වන ලද අතර, ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක නියාමන සීමාවන්ට ඉහළින් රඳවා ගනිමින් බැංකු අංශයේ **ස්ථායිතාව පවත්වා ගන්නා ලදී**

- **මුදල් සමාගම් අංශය ද**, 2024 වසරේ දී ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක සමඟ **ශක්තිමත්ව පැවතුණි**

- රටේ මූල්‍ය යටිතල පහසුකම් තවදුරටත් සුමටව ක්‍රියාත්මක වෙමින් මූල්‍ය අංශයේ ස්ථායිතාවයට පහසුකම් සලසන ලදී

2024 වසරේ මූල්‍ය පද්ධතියේ මුළු වත්කම්වල සංයුතිය



බැංකු අංශයේ ස්ථායිතාව අඛණ්ඩව පවත්වා ගන්නා ලදී

2.3 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය

අයිතමය	2023 (අ)		2024 (ආ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	2023	2024
වත්කම්						
ණය සහ ලැබිය යුතු දෑ	11,020.8	54.0	**11,473.7**	**51.7**	-2.6	**4.1**
ආයෝජන	7,299.9	35.8	**9,083.7**	**41.0**	23.1	**24.4**
වෙනත් (ඇ)	2,073.7	10.2	**1,618.2**	**7.3**	-4.5	**-22.0**
වගකීම්						
තැන්පතු	16,630.5	81.5	**17,969.4**	**81.0**	8.7	**8.1**
ණය ගැනුම්	1,397.4	6.9	**1,280.0**	**5.8**	-25.3	**-8.4**
ප්‍රාග්ධන අරමුදල්	1,765.5	8.7	**2,043.2**	**9.2**	10.5	**15.7**
වෙනත්	601.0	2.9	**883.1**	**4.0**	-7.3	**46.9**
මුළු වත්කම්/වගකීම්	20,394.4	100.0	22,175.7	100.0	5.0	8.7

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- 2023 වසරේ දී 2.6%ක සංකෝචනයක් වාර්තා කළ **ණය සහ ලැබිය යුතු දෑ**, 2024 වසරේ දී 4.1%කින් **වර්ධනය විය**
- **බැංකු අංශයේ** සමස්ත වගකීම්වලින් හා හිමිකම්වලින් 81.0%ක් නියෝජනය කරන ලද **තැන්පතු**, 2024 වසරේ දී 8.1%ක වර්ධනයක් වාර්තා කළේය
- **බැංකු අංශයේ අක්‍රීය ණය අනුපාතය/තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය**, 2023 වසර අවසානයේ වාර්තා වූ 12.8% සාපේක්ෂව 2024 වසර අවසානයේ දී **12.3%ක් දක්වා සුළු වශයෙන් අඩු විය**
- වත්කම් මත **ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ, පිළිවෙළින්, 2.6% සහ 15.6%** දක්වා ඉහළ දමමින් බැංකු අංශයේ **බදු පසු ලාභය** රුපියල් බිලියන 309.7ක් දක්වා වර්ධනය විය

2024 වසරේ දී මුදල් සමාගම් අංශය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය



- මුදල් සමාගම් අංශයේ **ණය සහ අත්තිකාරම් 2024 වසරේ දී 22.8% කින් වර්ධනය විය**
- දළ අක්‍රීය ණය අනුපාතය 2023 වසරේ පැවති 18.0% සිට 2024 වසරේ දී 11.3%ක් දක්වා අඩු වීම හේතුවෙන් **ණයවල ගුණාත්මකභාවය වැඩිදියුණු විය**
- **මුදල් සමාගම්වල ද්‍රවශීලතාවය, අවශ්‍ය අවම නියාමන මට්ටමට වඩා ඉහළ අගයක පැවතුණි**
- **බදු පසු ලාභය රුපියල් බිලියන 59.7ක් දක්වා ඉහළ ගියේය**

2024 වසරේ දී මූල්‍ය අංශයේ නෛතික සහ නියාමන රාමු තවදුරටත් ශක්තිමත් කරන ලදී

- 2024 වසරේ දී **බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීම,** බලපත්‍රලාභී බැංකු පාලනය කරන නෛතික රාමුව ශක්තිමත් කිරීමේ සන්ධිස්ථානයක් විය
- ඇති විය හැකි පද්ධතිමය අවදානම් හඳුනාගැනීමට සහ මූල්‍ය ස්ථායිතාව ශක්තිමත් කිරීමට **මහ බැංකුවේ සාර්ව විචක්ෂණ අධ්‍යයනය වැඩි දියුණු කිරීම**
- අවදානම් කළමනාකරණයට සහ ආයතනික යහපාලනය පිළිබඳ **නියාමන ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දීම**
- ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා සහාය වීමට **බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම**
- මූල්‍ය අංශයේ **මූල්‍ය සාක්ෂරතාව වර්ධනය, මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීම සහ ඩිජිටල් පරිවර්තනය ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව කටයුතු කිරීම**
- මහ බැංකුව මගින් සිදු කරනු ලබන **රාජ්‍ය ණය කළමනාකරණ කාර්යයන් නව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට ක්‍රමයෙන් පැවරීම**

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2024 අංක 24 දරන
බැංකු (සංශෝධන) පනත

CENTRAL BANK OF SRI LANKA

28 March 2024 CIRCULAR No. 02 of 2024

GUIDELINES FOR THE ESTABLISHMENT OF BUSINESS REVIVAL UNITS IN LICENSED BANKS

සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

නුදුරු කාලීනව, උද්ධමනය ධන අගයකට පත් වී, මැදි කාලීනව 5%ක ඉලක්කය ආසන්නයේ ස්ථායී වනු ඇතැයි පුරෝකථනය කර ඇත

මතුපිට උද්ධමනයේ පුරෝකථන
(කො.පා.මි.ද., කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේදී මහ බැංකුවේ ස්වාධීනත්වය මෙන්ම වැඩි විනිවිදභාවය සහ මහජන වගවීම මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා උපකාරී වනු ඇත

සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත්වීමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය මැදි කාලීනව එහි ධනාත්මක ආර්ථික වර්ධනය පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ

කාර්තුමය මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ගෝලීය ආර්ථික කම්පන හේතුවෙන් ආර්ථිකයේ ඉදිරි දැක්ම කෙරෙහි බලපෑමක් ඇති විය හැකි වුව ද, කාලීනව ගනු ලබන පූර්වෝපායික සහ ප්‍රතිචාරාත්මක ප්‍රතිපත්ති පියවර මගින්, ඉදිරියේදී ඇතිවන අහිතකර බලපෑම් සමනය කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ

සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

මුදල්	• මහ බැංකුව ඉදිරියේ දී ද දත්ත මත පදනම් වූ ප්‍රවේශයක් මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී අනුගමනය කරනු ඇත • රජයේ සුරකුම්පත් මත ඵලදා අනුපාතික සාමාන්‍යකරණය වී පවතිනු ඇති අතර දේශීය වෙළඳපොළ පොලී අනුපාතික බොහෝවිට පහළ මට්ටමක ස්ථායීව පවතිනු ඇත • බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රමාණය තවදුරටත් වර්ධනය වනු ඇත
විදේශීය	• මැදි කාලීනව වෙළඳ හිඟය කළමනාකරණය කළ හැකි මට්ටම්වල පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ • තෙල් මිල අඩු වීම හේතුවෙන් මැද පෙරදිග ආර්ථිකයන්හි අඩු වර්ධනය මැදි කාලීනව විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලට බලපෑම් කළ හැකි වුවද, 2025 දී එම ප්‍රේෂණ ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ • වෙළඳපොළ මත තීරණය වන විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීමෙන් සහ සංචිත ගොඩනැගීමෙන් විදේශීය අංශයේ ස්ථාවරත්වය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ
මූල්‍ය	• ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හා ප්‍රතිසංස්කරණ සහ වර්ධනය වූ සාර්ව මූල්‍ය තත්ත්වයන් මගින් 2025 වසර තුළ දී තවදුරටත් මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට අපේක්ෂිත ය • රජය සතු ව්‍යාපාර සඳහා බැංකු නිරාවරණය වීම ක්‍රමයෙන් පහළ යනු ඇත • 2026 වසර තුළ දී තුන්වන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සූදානම් වීමත් සමග මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ ක්‍රියාපටිපාටිය තවදුරටත් ශක්තිමත් වනු ඇත

2024 වාර්ෂික ආර්ථික විවරණය ප්‍රකාශනයෙන් පසු එක්සත් ජනපදය සිදුකළ තීරුබදු වෙනස්කම් පිළිබඳ නවතම තත්ත්වය

මෙම වාර්තාව සකස් කර අවසන් වන විට එක්සත් ජනපදය අන්‍යෝන්‍ය තීරුබදු පිළිබඳ නිල නිවේදනයක් නිකුත් කර නොතිබිණි

එහෙත්, තීරුබදු වැඩිවීමක් සිදුවුවහොත් එමගින් ශ්‍රී ලංකාවට බලපෑම් සිදු විය හැකි මූලයන් පිළිබඳව වාර්තාවේ කෙටියෙන් සාකච්ඡා කර ඇත

ශ්‍රී ලංකාවෙන් ඇමරිකා එක්සත් ජනපදයට අපනයනය කරන භාණ්ඩ සඳහා **44% ක** අන්‍යෝන්‍ය තීරුබද්දක් 2025 වසරේ අප්‍රේල් 02 වන දින ප්‍රකාශයට පත් කරන ලද අතර එය 2025 වසරේ අප්‍රේල් 09 වන දින සිට ක්‍රියාත්මක විය. **පසුව, මෙම ඉහළ තීරු බද්ද මාස 3 කට අත්හිටුවන ලදී. ඒ අනුව, 10%ක ගෝලීය සාමාන්‍ය තීරුබදු ප්‍රතිශතය දැනට ශ්‍රී ලංකාවට අදාළ වේ**

ශ්‍රී ලංකාව ඇමරිකානු බලධාරීන් සමඟ සාකච්ඡා ආරම්භ කළේය. **ශ්‍රී ලංකාව සහ ඇමරිකානු බලධාරීන් අතර පළමු වටයේ සාකච්ඡා දැනටමත් සිදුවී ඇති අතර සාකච්ඡා අඛණ්ඩව සිදු කරගෙන යමින් පවතී**

විදේශීය වෙළඳාම පිළිබඳ අවිනිශ්චිතතාවයන් ලිහිල් වීම පිළිබඳ **ධනාත්මක සලකුණු මැතකදී මතුවෙමින් තිබේ**

එක්සත් ජනපදයේ තීරුබදු වෙනස්කම් ගෝලීය ආර්ථිකයට ඉහළ බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ

වර්ධනය හා වෙළඳාම

- 2025 වසරේ දී ගෝලීය ආර්ථික වර්ධනය **2.8%** දක්වා මන්දගාමී වනු ඇතැයි ජා.මූ. අරමුදල පුරෝකථනය කරයි
- ලෝක වෙළඳ සංවිධානය 2025 වසර සඳහා ගෝලීය වෙළඳ භාණ්ඩ පරිමා පුරෝකථනය **-0.2%** දක්වා අඩු කර ඇත
- වෙළඳ අවිනිශ්චිතතාවය සහ ගෝලීය විභේදනයන් වැඩිවීම **ආයෝජන අඩු වීමට, වෙළඳපොළ කාර්යක්ෂමතාව අඩු වීමට, වෙළඳ ප්‍රවාහවල දැඩි වෙනසක් ඇති වීම සහ සැපයුම් දාම අවහිර වීමට** හේතු විය හැක

උද්ධමනය සහ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් වීම

- තීරුබදු මගින් ඇතිවන අවිනිශ්චිත උද්ධමන බලපෑම
- මුදල් ප්‍රතිපත්තිය සඳහා වන බලපෑම රටට ආවේණික වූ බලපෑම් අනුව තීරණය විය හැකිය
- දිගු කාලීනව ඉහළ මට්ටමක පවතින පොලී අනුපාත වල බලපෑම්
  - **මූල්‍ය, රාජ්‍ය මූල්‍ය සහ විදේශීය අංශයන්හි අවදානම් වැඩි වීම**
  - **ප්‍රාග්ධන ප්‍රවාහවල වෙනස්වීම් සහ ගෝලීය අසමතුලිතතා ඇති වීම**
  - **ගෝලීය වශයෙන් දැඩි මූල්‍ය තත්ත්වයන් ඇති වීම**

4.1 රූප සටහන: ගෝලීය ආර්ථික ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශකය (Global Economic Policy Uncertainty Index)



සටහන: 2025 මාර්තු වන විට දර්ශක අගය දර්ශක ලක්ෂ්‍ය 543 දක්වා තවදුරටත් ඉහළ ගොස් ඇත

ශ්‍රී ලංකාවේ අපනයනවලින් ඉහළ දායකත්වයක් ඇමරිකානු වෙළඳපොළ දැක්වීම හේතුවෙන් අපනයනවලට සෘණාත්මක බලපෑම් ඇති විය හැක

ශ්‍රී ලංකාව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර සමස්ත වෙළඳාම (එ.ජ.ඩො. මිලියන)

	2017*	2018*	2019*	2020*	2021	2022	2023	2024
අපනයන	2,909	3,085	3,141	2,500	3,108	3,321	2,769	2,911
අපනයන ප්‍රමාණය %	**25.6**	**25.9**	**26.3**	**24.9**	**24.9**	**25.3**	**23.2**	**22.8**
ආනයන	492	519	542	495	511	378	504	443
ආනයන ප්‍රමාණය %	2.3	2.3	2.7	3.1	2.5	2.1	3.0	2.4
ඇමරිකා එක්සත් ජනපදය සමඟ වෙළඳ ශේෂය	**2,417**	**2,566**	**2,600**	**2,006**	**2,597**	**2,942**	**2,265**	**2,468**

* ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ කාල සීමාව

ඇඟලුම්, රෙදිපිළි උපාංග, රබර් ආශ්‍රිත නිෂ්පාදිත, පොල් ආශ්‍රිත නිෂ්පාදිත, යකඩ සහ වානේ, සෙල්ලම් බඩු ආදී අපනයන අංශයන් ඇමරිකානු වෙළඳපොළට ඉහළ දායකත්වයක් දැක්වීම හේතුවෙන් අවදානමට ලක් විය හැකිය

ශ්‍රී ලංකාව - ඇ. එ. ජ. සමඟ සිදුකරන අපනයනවල සංයුතිය - 2024



මූලය: ශ්‍රී ලංකා රේගුව

සමාප්ති සටහන්

ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වූ ආර්ථික පසුබෑම මගින්
පුරවැසියන්ට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා සහ
ඉහළ ගොස් ඇති ආර්ථික අවදානම් හේතුවෙන්,
ප්‍රතිපත්තිමය වැරදි සිදු කිරීමට ඉඩක් නොමැත

ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික සමෘද්ධිමත්භාවය
බොහෝ දුරට රඳා පවතින්නේ
වෙහෙස වී ඇති කරගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය
ආරක්ෂා කිරීම සහ වර්ධනය ඉලක්ක කරගත්
සුදුසු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මත වේ

තිරසර ස්ථාවරත්වය සහ දිගු කාලීන ආර්ථික වර්ධනයක් වෙත රට ගෙනයාමට ගත යුතුව ඇති පියවර

- දැනට ක්‍රියාත්මක වන සාර්ව ආර්ථික ගැළපුම් සහ වර්ධනය වැඩිදියුණු කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ දැඩි කැපවීමකින් ක්‍රියාත්මක කිරීම
- අඛණ්ඩ විචක්ෂණශීලිභාවයකින් යුතුව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ බාහිර සහ රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක තවදුරටත් ශක්තිමත් කිරීම
- විදේශීය අංශයේ කාර්ය සාධනය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම
- නිෂ්පාදන සහ විදේශ විනිමය උත්පාදනය කරන අංශ සඳහා විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
- ආයෝජකයින් වෙනුවෙන් සාධාරණ සහ ආරක්ෂිත ව්‍යාපාරික පරිසරයක් සහතික කිරීම
- තාක්ෂණය භාවිතා කිරීම, ඩිජිටල් අන්තර්ගතභාවය සහ කුසලතා වර්ධනය හරහා සිදු කෙරෙන ව්‍යුහාත්මක ආර්ථික පරිවර්තන
- ස්ථාවර ප්‍රතිපත්ති සහ අවශ්‍ය නෛතික, නියාමන සහ ආයතනික සහයෝගය තුළින් පෞද්ගලික අංශයේ සහභාගීත්වයට සහාය දැක්වීම

විශේෂාංග රූප සටහන්

1.1. දේශීය ඉන්ධන අලෙවියෙහි සහ මිල ගණන්වල ප්‍රවණතා

1.2. විදුලිය සහ ඉන්ධන වැනි උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණයේ වැදගත්කම

1.3. මාසික විදේශීය ජංගම ගිණුමේ සංඛ්‍යාන දත්ත

1.4. අර්බුදයට පෙර ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම සහ අර්බුදයෙන් පසු මූල්‍ය ගිණුමේ හැසිරීම

1.5. ශ්‍රී ලංකාවේ සංචිත ප්‍රමාණාත්මකතා දර්ශක වර්ධනය වීම

1.6. ආර්ථික අර්බුදයෙන් පසු ජාත්‍යන්තර සංචිත නැවත යථා තත්ත්වයට පත් වීම

1.7. නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ වන විනිමය අනුපාතික ප්‍රවණතා

1.8. රාජ්‍ය ආදායම, වියදම සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්

උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණයේ වැදගත්කම



මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

- ශ්‍රී ලංකාවේ උපයෝගිතා **සහනාධාර නිසි ලෙස ඉලක්කගත නොවීම,** රාජ්‍ය මූල්‍ය කෙරෙහි පීඩනයක් එල්ල කළ අතර එමගින් **අනෙකුත් ආයෝජන අවස්ථා සඳහා වූ අවකාශ සීමා** විය
- ඉලක්කගත නොවූ බලශක්ති සහනාධාර මගින් මහජනතාවට සහ ව්‍යාපාරවලට කෙටි කාලීන සහනයක් ලැබුණ ද, **අවසානයේ දී එහි දිගු කාලීන පිරිවැය,** ඉහළ බලශක්ති මිල ගණන්, බදු සහ සමස්ත උද්ධමනයේ ඉහළ යෑම වශයෙන් **දැරීමට ඔවුන්ට සිදු විය**
- **උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල නියම කිරීමේ ක්‍රමවේදයෙන් අපගමනය වීම** රජය හෝ ව්‍යාපාර හෝ මහජනතාවට දිගු කාලීනව **වාසිදායක නොවේ**

අර්බුදයට පෙර ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම සහ අර්බුදයෙන් පසු මූල්‍ය ගිණුමේ හැසිරීම

ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- අර්බුදයට පෙර, ශ්‍රී ලංකාවේ ජංගම ගිණුම් හිඟයන් බොහෝ දුරට මූල්‍යනය කර ඇත්තේ විදේශ ණය සහ ආයෝජන මගිනි
- නමුත් 2020 වසර සිට 2022 වසර දක්වා ලැබීම් අඩු වීම, විදේශ සංචිත සැලකිය යුතු ලෙස අඩු වීමකට හේතු විය
- අර්බුදයෙන් පසු විදේශීය අංශයේ ස්ථාවරත්වය 2023 වසර සහ 2024 වසරේ දී අතිරික්තයන්ට හේතු වූ අතර, සංචිත සැලකිය යුතු ලෙස වැඩි වීමට සහ බැංකු අංශයේ විදේශ වත්කම් ශක්තිමත් කිරීමට දායක විය

විශේෂ සටහන්

1. විදේශීය අංශයේ සංඛ්‍යාන දත්ත වැඩිදියුණු කිරීම: සේවා වෙළඳාම පිළිබඳ ප්‍රධාන කරුණු
2. බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මෑතකාලීනව සිදු කරන ලද ප්‍රතිසංස්කරණ
3. නව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම
4. මුදල් ප්‍රතිපත්තිමය වගවීම සහ උද්ධමන ඉලක්ක

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම

වි.ස. 3.2 රූප සටහන: එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ නිත්‍ය පහසුකම් අනුපාතික



මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම්දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එහි ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දුන්නේය

මෙයින්,

- ✓ *මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය සරල කිරීම*
- ✓ *මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම*
- ✓ *ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ අවිනිශ්චිතභාවය අඩු කිරීම*
- ✓ *වැඩි විශ්වාසයකින් යුතුව දැනුම්වත් තීරණ ගැනීමට පහසුකම් සැපයීම*
- ✓ *මූල්‍ය උපකරණ වඩාත් නිරවද්‍යතාවයකින් මිල කළ හැකි වීම*

විශේෂ සටහන්

විදේශීය අංශයේ සංඛ්‍යාන දත්ත වැඩිදියුණු කිරීම: සේවා වෙළඳාම පිළිබඳ ප්‍රධාන කරුණු

විදේශීය අංශයේ සංඛ්‍යාන දත්තවල නිරවද්‍යතාවය සහ සවිස්තරාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා, **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කරන ලදී**

ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් බැංකු පද්ධතිය තුළ වාර්තා වන විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම් දත්ත මත පදනම්ව **දේශසීමා හරහා** සිදුවන ගනුදෙනු එක්රැස් කර වර්ගීකරණය කරනු ලැබේ

ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් මහ බැංකුවට **මාසිකව සේවා අංශයේ සංඛ්‍යාන දත්ත** නිකුත් කිරීමට හැකියාව ලැබුණි

ජංගම ගිණුම් සංඛ්‍යාන දත්ත ප්‍රකාශයට පත් කරන වාර ගණන වැඩි කිරීම සහ ඒවායේ නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම **ප්‍රතිපත්ති සම්පාදකයින්ට** වටිනා තොරතුරු ලබා දෙයි

වි.ස. 1.1 රූප සටහන: වෙළඳ භාණ්ඩ සහ සේවා අපනයන පිළිබඳ සංඛ්‍යාන දත්ත



වි.ස. 1.2 රූප සටහන: සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් හැර සේවා ගිණුම පිළිබඳ සංඛ්‍යාන දත්ත



2024 වාර්ෂික ආර්ථික සමාලෝචනය සඳහා තවත් දත්ත මහ බැංකු වෙබ් අඩවිය හරහා ලබා ගත හැකිය

සම්පූර්ණ වාර්තාවට ප්‍රවේශ වීමට **QR** කේතය පරිලෝකනය කරන්න...

ස්තූතියි!